10 ඒකකය - අණ්වීක්ෂයේ නිවැරදි භාවිතය (2)

✓ **පෙළ පොත හෝ වෙනත් සුදුසු ඉගෙනුම් සම්පත් පරිශීලනයෙන් පහත ක්‍රියාකාරකම් සම්පූර්ණ කරන්න.**

01. සංයුක්ත ආලෝක අණ්වීක්ෂයක් භාවිත කිරීමේ නිවැරදි පිළිවෙළ විස්තර කරන්න.

02. අණ්වීක්ෂ භාවිතයේ දී සැලකිලිමත් විය යුතු කරුණු මොනවා ද?

03. ඉලෙක්ට්‍රෝන අණ්වීක්ෂණය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.

04. ඉලෙක්ට්‍රෝන අණ්වීක්ෂය භාවිතාවන අවස්ථා කිහිපයක් ලියන්න.

05. බැක්ටීරියාවල ඉලෙක්ට්‍රෝන අණ්වීක්ෂීය රූපයක් අඳින්න.

06. AIDS වෛරසයේ ඉලෙක්ට්‍රෝන අණ්වීක්ෂීය රූපයක් අඳින්න.

07. CORONA වෛරසයේ ඉලෙක්ට්‍රෝන අණ්වීක්ෂීය රූපයක් අඳින්න.

08.
- i) සරල අන්වීක්ෂය ලෙස යොදා ගන්නේ කුමන වර්ගයේ කාචයක්ද?
- ii) ආලෝක අන්වීක්ෂයේ විශාලනය සඳහා ප්‍රකාශයක් ලියන්න.
- iii) ආලෝක අන්වීක්ෂයේ ප්‍රාචිරය කුමක් සඳහා යොදා ගනීද?
- iv) සංයුක්ත අන්වීක්ෂය දිගුකලක් භාවිතා නොකරන්නේ නම් කාච වල ආරක්ෂාව සඳහා ගත යුතු ක්‍රියාමාර්ග කුමක්ද?
- v) ජාන විද්‍යාත්මක පර්යේෂණ කටයුතු සඳහා කුමන වර්ගයේ අන්වීක්ෂයක් භාවිතා කෙරේද?
- vi) අන්වීක්ෂයක විශාලන බලය යන්නෙන් කුමක් අදහස් වේද?
- vii) අන්වීක්ෂයක විභේදන බලය යන්නෙන් කුමක් අදහස් වේද?

09.
- i) එකලඟ පිහිටි ලක්ෂ්‍යය 2ක් පියවි ඇසින් බලා වෙන්කර හඳුනාගැනීමට එම ලක්ෂ්‍යය දෙක අතර තිබිය යුතු අවම පරතරය කොපමණද?
- ii) ප්‍රධාන වශයෙන් හඳුනාගත හැකි අවනෙත් වර්ග 3 මොනවාද?
- iii) ආලෝක අන්වීක්ෂයේ දර්පණය කුමක් සඳහා අවශ්‍ය වේද?
- iv) සංයුක්ත අන්වීක්ෂයෙන් නිරීක්ෂණය කළ හැකි කුඩා වස්තු 2 ක් ලියන්න.
- v) සංයුක්ත අන්වීක්ෂයෙන් රැගෙන යාමේදී පිළිපැදිය යුතු උපදෙස් 2ක් ලියන්න.